<u>මහජන නිවේදනය</u>

2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම පිළිබඳ නිරීක්ෂණ, අදහස්, නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කරන ලෙස සියලුම දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ඇතුළු ව මහජනතාවගෙන් ඉල්ලා සිටීම.

අමාත්‍ය මණ්ඩලයේ තීරණයකට අනුකූලව, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් 2024 අංක 9 දරන මාර්ගගත ආරක්ෂණ පනත, 2024 ජූලි 31 වන දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද සංශෝධන සලකා බැලීමටත් සහ මහජන අදහස් විමසා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමටත් කමිටුවක් පත් කරන ලදී.

ඒ අනුව, මෙම නිවේදනය පළකිරීමේ දින සිට මාසයක් (01) ඇතුළත, 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම පිළිබඳ මහජනතාවගෙන් නිරීක්ෂණ, අදහස්, නිර්දේශ සහ යෝජනා කැඳවීමට එම කමිටුව තීරණය කර ඇත.

ඔබගේ නිරීක්ෂණ, අදහස්, නිර්දේශ හෝ යෝජනා, ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, නො.19 ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ10 යන ලිපිනයට තැපෑලෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ " 2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වන කමිටුව" යනුවෙන් සඳහන් කොට යොමු කළ හැක.

විකල්ප වශයෙන්, ඔබගේ අදහස් "2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වන කමිටුව" යන ශීර්ෂය යටතේ legal@moj.gov.lk යන විද්‍යුත් ලිපිනය ඔස්සේ ද යොමු කළ හැකිය.

ලේකම්

2024 අංක 09 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වන කමිටුව.